VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY

# නිදහස්කිරීම්

ජාතික තක්සේරු වැඩසටහන - සාක්ෂරතාවය සහ සංඛ්‍යාමය හැකියාව (NAPLAN) යනු 3 , 5 , 7 සහ 9 වෙනි වසරවල සිසුන් සඳහා වූ තක්සේරු වැඩසටහනකි.

පරීක්ෂණ ප්‍රතිඵල, ඉගෙනීමේදී සහ ඉගැන්වීමේදී යොදාගතහැකි සිසු සාධනය පිළිබඳ තොරතුරු සිසුන්ට, දෙමාපියන්ට, ගුරුවරුන්ට සහ විදුහල්පතිවරුන්ට සපයයි.

NAPLAN පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.vcaa.vic.edu.au වෙබ් අඩවියෙහි දෙමව්පියන් සඳහා ඇති පොත් පිංච බලන්න.

සමහර අවස්ථාවල NAPLAN පරීක්ෂණයෙන් සිසුන් නිදහස් කරනු ඇත. විදුහල්පතිවරයා විසින් නිදහස් කරනුයේ පහත සඳහන් සිසුන්ට පමණි.

- **බුද්ධිමය නොහැකියා ඇති සිසුන්ට**

තක්සේරු අවස්ථාවකදී ඔහුට / ඇයට වැඩකිරීමට නොහැකි තරම් සැලකියයුතු බුද්ධිමය නොහැකියාවක් ඇති සිසුන්ව නිදහස් කළ හැකිය. තක්සේරුකිරීමක සාමාන්‍ය උපදෙස් පවා පිළිපැදීමට නොහැකි සිසුන් මෙයට ඇතුළත් වේ. කෙසේවෙතත් විනය පිළිබඳ ගැටලු හෝ දුර්වල ඉගෙනුම් කාර්යසාධනය නිසා පමණක් සිසුන් ඉවත්කළ නොහැකිය. විශේෂ කොන්දේසි යටතේ ඇතුළත් කළ හැකි සිසුන් තක්සේරු කළ යුතුය. විශේෂ කොන්දේසි පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පාසල සමග සාකච්ඡා කරන්න.

- **වසරකට වඩා අඩු කාළයක් ඉංග්‍රිසි ඉගෙනගත් සිසුන්**

ඉංග්‍රිසි නොවන භාෂා පසුබිමක් ඇතුව විදේශවලින් පරීක්ෂණයට පෙර වසරකට අඩුකාළයක දී පැමිණෙන සිසුන් නිදහස් කළ හැකිය.

පරීක්ෂණ එකකින් හෝ ඊට වැඩි ගනණකින් සිසුන් නිදහස් කරනු ඇත.

වාර්තා පිලිවෙල කිරීමේදී ඕනෑම NAPLAN පරීක්ෂණයකින් නිදහස් කරනු ලැබූ සිසුන් ජාතික අවම සම්මතියට පහලින් සිටින ලෙස වර්ග කරනු ඇත.

ඉහත දැක්වූ හේතු වලට අමතර හේතු නිසා NAPLAN පරීක්ෂණයට සහභාගී නොවන සිසුන් නිදහස් කළු සිසුන් ලෙස ලියාපදිංචි නොවේ.

නිදහස්වූ සෑම ශිෂ්‍යයෙකු වෙනුවෙන්ම නිදහස්වීමේ ආකෘති පත්‍ර වාර්තාව සම්පූර්ණ කර, විදුහල්පති සහ දෙමාපියෙක් හෝ භාරකරු විසින් අත්සන් කළ යුතුය.

පරීක්ෂණ පවත්වන දිනයේදී නොපැමිණි නිදහස්කෙරුණ සිසුන් **නොපැමිණි** සිසුන් ලෙස නොව **නිදහස් කළ** සිසුන් ලෙස වාර්තා විය යුතුය.